| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5. ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා සැලසුම් සකස් කරයි. | | | | 45 |
| | 5.1 ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාව අනාවරණය කරයි. | • ව්‍යාපාර සැලැස්ම<br>• හැඳින්වීම<br>• ප්‍රයෝජන<br>• ව්‍යාපාර සැලැස්මක සංයුතිය | • ව්‍යාපාර සැලැස්ම හඳුන්වයි.<br>• ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාව සාකච්ඡා කරයි.<br>• ව්‍යාපාර සැලැස්මක මූලිකාංග විස්තර කරයි. | 03 |
| | 5.2 නිෂ්පාදිත සඳහා අලෙවි ඇස්තමේන්තුවක් පිළියෙල කරයි. | • **අලෙවි ඇස්තමේන්තුව**<br>• හැඳින්වීම<br>• අලෙවි ඇස්තමේන්තුවට අදාළ තොරතුරු<br>• වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු<br>• යෝජිත ව්‍යාපාරයේ අලෙවිකරණ උපාය මාර්ග<br>• විකුණුම් පුරෝකථනය<br>• අලෙවි ආදායම හා අලෙවි වියදම<br>• අලෙවි ස්ථාවර වත්කම් | • අලෙවි ඇස්තමේන්තුවක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය වෙළෙඳපොළ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• අලෙවිකරණ උපායමාර්ග නිදසුන් සහිතව පැහැදිලි කරයි.<br>• දෙන ලද වෙළෙඳපොළ තොරතුරු පදනම් කරගෙන අලෙවි ඇස්තමේන්තුවක් පිළියෙල කරයි. | 09 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3 පුරෝකථනය කරන ලද අලෙවිය සැළකිල්ලට ගෙන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කරයි. | • **නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව**<br>• හැඳින්වීම<br>• නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන යෙදවුම්<br>• ස්ථාවර වත්කම්<br>• අමුද්‍රව්‍ය<br>• ශ්‍රමය<br>• නිෂ්පාදන පිරිවැය<br>• අමුද්‍රව්‍ය පිරිවැය<br>• ශ්‍රම පිරිවැය<br>• නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය<br>• ඒකක පිරිවැය | • නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය කෙරෙන සම්පත් නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• අපේක්ෂිත නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය යෙදවුම්වල වටිනාකම ගණනය කරයි.<br>• අපේක්ෂිත නිෂ්පාදනයක මුළු නිෂ්පාදනය පිරිවැය ඇස්තමේන්තු කර ඒකක පිරිවැය ගණනය කරයි. | 09 |
| | 5.4 යෝජිත ව්‍යාපාරයක පරිපාලන කටයුතුවලට අදාළ ඇස්තමේන්තුව පිළියෙල කරයි. | • පරිපාලන කටයුතුවලට අදාළ ඇස්තමේන්තුව<br>• හැඳින්වීම<br>• පරිපාලනමය තනතුරු හා කාර්යයන්<br>• සේවක වැටුප් හා වේතන<br>• අනෙකුත් පරිපාලන වියදම්<br>• පරිපාලන ස්ථාවර වත්කම් | • යෝජිත ව්‍යාපාරයක පරිපාලන කටයුතුවලට අදාළ සැලැස්මේ ඇතුළත් තනතුරු හා එම තනතුරුවලට අදාළ කාර්යයන් සඳහා නිදසුන් දක්වයි.<br>• යෝජිත ව්‍යාපාරයක පරිපාලන කටයුතුවලට අදාළ වියදම් ගණනය කරයි.<br>• යෝජිත ව්‍යාපාරයක් සඳහා පරිපාලන වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.5 මූල්‍ය සැලැස්මේ මෙහෙයුම් පෙර වියදම් ඇස්තමේන්තුව පිළියෙල කරයි. | • මූල්‍ය ඇස්තමේන්තුව<br>• හැඳින්වීම<br>• ව්‍යාපාරයක් ඇරඹීමට පෙර කාර්යයන් හා වියදම්<br>• හැඳින්වීම<br>• වෙළෙඳපොළ සමීක්ෂණය<br>• ස්ථානය සංවර්ධනය කිරීම<br>• ද්‍රව්‍ය සහ උපකරණ සොයා බැලීම<br>• ලියාපදිංචි කිරීම<br>• වෙනත් | • යෝජිත ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර කළ යුතු කාර්යයන් සඳහා නිදසුන් දක්වයි.<br>• යෝජිත ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර සිදු කළ යුතු කාර්යයන් සඳහා අපේක්ෂිත වියදම් ගණනය කරයි.<br>• දෙන ලද ව්‍යාපාරයක මෙහෙයුම් පෙර වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කරයි. | 03 |
| | 5.6 අපේක්ෂිත ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන මුළු වියදම් සැලකිල්ලට ගෙන ආයොජන ඇස්තමේන්තුව පිළියෙල කරයි. | • මුළු ආයෝජන ඇස්තමේන්තුව<br>• හැඳින්වීම<br>• ස්ථාවර වත්කම්<br>• ආරම්භ කිරීමට පෙර දැරිය යුතු මුළු වියදම්<br>• එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා අත තබා ගත යුතු මුදල් | • යෝජිත ව්‍යාපාරයක මුළු ආයෝජන ඇස්තමේන්තුවක ඇතුළත් වන අයිතම නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.<br>• යෝජිත ව්‍යාපාරයක දෛනික කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කෙරෙන වියදම් පුරෝකථනය කරයි.<br>• දෙන ලද ව්‍යාපාරයක් සඳහා මුළු ආයෝජන ඇස්තමේන්තුවක් පිළියෙල කරයි. | 06 |
| | 5.7 අපේක්ෂිත මුදල් ගලා ඒම් හා මුදල් ගලායාම් ඇතුළත් ලේඛනයක් පිළියෙල කරයි. | • මුදල් ගලාඒම් හා මුදල් ගලායාම්<br>• හැඳින්වීම<br>• අපේක්ෂිත මුදල් ගලා ඒම්<br>• අපේක්ෂිත මුදල් ගලා යාම් | • යෝජිත ව්‍යාපාරයක මුදල් ගලාඒම් සඳහා නිදසුන් දක්වයි.<br>• යෝජිත ව්‍යාපාරයක මුදල් ගලායාම් සඳහා නිදසුන් දක්වයි.<br>• දෙන ලද ව්‍යාපාරයක මුදල් ගලාඒම් සහ ගලායෑම් ඇතුළත් ලේඛනයක් පිළියෙල කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.8 අපේක්ෂිත වියදම් හා ආදායම් සැළකිල්ලට ගනිමින් ව්‍යාපාර කටයුතුවල ප්‍රතිඵලය ගණනය කරයි. | • ව්‍යාපාර ප්‍රතිඵලය ගණනය<br>• හැඳින්වීම<br>• මුළු ආදායම්<br>• මුළු වියදම්<br>• අපේක්ෂිත ලාභය | • නිශ්චිත කාලයක ව්‍යාපාර ප්‍රතිඵල ගණනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන අයිතම නිදසුන් සහිතව දක්වයි.<br>• දෙන ලද ව්‍යාපාරයක ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන අයිතම වටිනාකම් සහිතව දක්වයි.<br>• දෙන ලද ව්‍යාපාරයක නිශ්චිත කාලයක් සඳහා ප්‍රතිඵලය ගණනය කරයි. | 06 |
| **6. ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා යෝග්‍ය සංවිධාන වර්ග විමර්ශනය කරයි.** | 6.1 ව්‍යාපාර සංවිධාන වර්ග අධ්‍යයනය කරයි. | • ව්‍යාපාර සංවිධාන වර්ග<br>• හැඳින්වීම<br>• අරමුණ අනුව වර්ග කිරීම<br>• අයිතිය අනුව වර්ග කිරීම | • ව්‍යාපාර සංවිධාන නිදසුන් සහිතව පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර සංවිධාන අරමුණු අනුව වර්ග කොට නිදසුන් දක්වයි.<br>• ව්‍යාපාර සංවිධාන අයිතිය අනුව වර්ග කොට දක්වයි. | **24**<br>03 |
| | 6.2 කේවල ස්වාමි ව්‍යාපාර සංවිධාන විමර්ශනය කරයි. | • කේවල ස්වාමි ව්‍යාපාර<br>• හැඳින්වීම<br>• මූලික ලක්ෂණ<br>• ආරම්භ කිරීම<br>• වාසි හා සීමා | • කේවල ස්වාමි ව්‍යාපාරවල මූලික ලක්ෂණ සඳහා නිදසුන් සපයයි.<br>• කේවල ස්වාමි ව්‍යාපාර ආරම්භ කිරීමේ පටිපාටිය පැහැදිලි කරයි.<br>• කේවල ස්වාමි ව්‍යාපාරවල පවත්නා වාසි හා සීමා ඉදිරිපත් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7. ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහිවීමට ඇති ඉඩප්‍රස්ථා ගවේෂණය කරයි. | | | | 21 |
| | 7.1 ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය වීමට ඇති ඉඩප්‍රස්ථා හා ඒ හා සම්බන්ධව පවත්නා සීමා ගවේෂණය කරයි. | • ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණයවීමට ඇති ඉඩප්‍රස්ථා<br>• ව්‍යවසායකත්ව සංස්කෘතිය හැඳින්වීම<br>• ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණයවීමේ අවශ්‍යතාව<br><br>• ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණයවීම සඳහා හිතකර වන සමාජයීය සහ ආර්ථික සාධක<br>  • රටේ ආර්ථිකය හා දේශපාලනය<br>  • රජය සහ වෙනත් ආයතනවල දිරිදීම්<br>  • පවුලේ ව්‍යාපාර අඛණ්ඩව කර ගෙනයාම<br>  • සම්පත් ලබා ගැනීමේ හැකියාව<br>  • විශාල ව්‍යාපාරවලින් ලැබෙන දිරිමත් කිරීම්<br>  • ආදර්ශ චරිත<br>  • විවිධ පාර්ශ්වයන්ගේ දිරිමත් කිරීම්<br><br>• ව්‍යවසායකත්වයට ඇල්මක් ඇතිවීමට එරෙහිවන සමාජයීය සාධක | • ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංස්කෘතියක අවශ්‍යතාව සඳහා හේතු දක්වයි.<br>• ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහිවීමට බලපාන ආර්ථික හා සමාජයීය සාධක සඳහා නිදසුන් දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහිවීමට බාධාවන සාධක පැහැදිලි කරයි. | 06 |

| | | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.2 ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව පරිසරයක් නිර්මාණය වීමෙහිලා කාන්තා භූමිකාවේ අවශ්‍යතාව විමර්ශණය කරයි. | • ව්‍යවසායකයකු වශයෙන් කාන්තා භූමිකාව<br>• හැඳින්වීම<br>• කාන්තාවන් ව්‍යාපාර කිරීම සඳහා ඉදිරිපත් වීමේ අවශ්‍යතාව හා ඒ සඳහා ඇති ඉඩප්‍රස්ථා<br>• ව්‍යවසායිකාවක් වශයෙන් කාන්තාවන් තුළ ඇති ශක්තීන්<br>• කාන්තාවන් ව්‍යාපාර කිරීම හා සම්බන්ධව පවත්නා බාධා | • කාන්තාවන් ව්‍යවසායකත්වය කෙරේ යොමුවීමේ අවශ්‍යතාව සනාථ කරයි.<br>• ව්‍යවසායකත්ව කාර්යභාරය සිදු කිරීම සඳහා කාන්තාවන් තුළ පවත්නා ශක්තීන් සාකච්ඡා කරයි.<br>• කාන්තාවන් ව්‍යාපාරවල නිරතවීම සම්බන්ධව ශ්‍රී ලාංකික සමාජය තුළ පවත්නා සීමාවන් සඳහා නිදසුන් දක්වයි. | 06 |
| | 7.3 සමාජ වගකීම් හා ආචාරධර්ම පිළිපදිමින් යහපත් ව්‍යවසායකත්ව සංස්කෘතියක් ගොඩනැගීමෙහිලා දායකවීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි. | • ව්‍යාපාරවල සමාජ වගකීම් හා ව්‍යාපාර ආචාර ධර්ම<br>• හැඳින්වීම<br>• ව්‍යාපාර කෙරේ උනන්දුවක් දක්වන පාර්ශ්ව<br>• ව්‍යාපාරවල සමාජ වගකීම හා ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව | • ව්‍යාපාර සමාජ වගකීම් හා ආචාර ධර්ම පිළිබඳව ස්වකීය අදහස පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර විසින් සමාජ වගකීම් ඉටු කිරීමට බැඳී ඇති පාර්ශ්ව නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරවල සමාජ වගකීම් හා ආචාර ධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව සාකච්ඡා කරයි. | 03 |
| | 7.4 නව ව්‍යාපාර ආරම්භ කරන්නන් දිරිගැන්වීම සඳහා කටයුතු කරන ආයතන හා වැඩසටහන් පිළිබඳව සොයා බැලීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි. | • නව ව්‍යාපාර ආරම්භ කරන ව්‍යාපාරිකයින් සඳහා පවත්නා දිරිගැන්වීම් හා ආයතන<br>• හැඳින්වීම හා අවශ්‍යතාව<br>• දිරිගැන්වීම් වර්ග<br>• මූල්‍ය<br>• මූල්‍ය නොවන<br>• දිරිගැන්වීම් සපයන ආයතන<br>• මූල්‍ය දිරිගැන්වීම්<br>• මූල්‍ය නොවන දිරිගැන්වීම් | • නව ව්‍යාපාර සඳහා දිරිගැන්වීම් ලබාදීමේ අවශ්‍යතාව සාකච්ඡා කරයි.<br>• ශ්‍රී ලංකාවේ ව්‍යවසායකින්ට සපයන මූල්‍ය හා මූල්‍ය නොවන දිරිගැන්වීම් සඳහා නිදසුන් සපයයි.<br>• ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයින්ට මූල්‍ය හා මූල්‍ය නොවන හා දිරිගැන්වීම් සපයන ආයතන සඳහා නිදසුන් දක්වයි. | 06 |
| | | | | 90 |